සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I & II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

- **I කොටසේ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

1) දිවැසිවරයා හැඳින්වීමට 'නබී' යන වචනය යොදන භාෂාව වන්නේ
1. හෙබ්‍රෙව් 2. ග්‍රීක 3. ඉංග්‍රීසි 4. ලතින්

2) දේශක දිවැසිවරයෙක් නම්
1. යෙසායා දිවැසිවරයා 2. එසෙකියෙල් දිවැසිවරයා
3. මලාකි දිවැසිවරයා 4. නාතාන් දිවැසිවරයා

3) පුරාණ ගිවිසුම තුළ සිටින, විශේෂ පුද්ගල කණ්ඩායමකි,
1. රජවරු 2. වීරවරු 3. ජන නායකයෝ 4. දිවැසිවරු

4) දිවැසාවලියේ සඳහන් පරිදි, සුළු දිවැසිවරුන්ගේ ගණන ……………..
1. 10 කි 2. 11 කි 3. 12 කි 4. 13 කි

5) ශුද්ධ වු සභාව තුළ, දිවැසිවරුන් ලෙස අපව ආලේප කරන්නේ …………….. නම් ප්‍රසාද නිධානයෙනි
(හිස්තැනට සුදුසු වචනය වන්නේ)
1 රෝගීන්ගේ ආලේපය 2 ප්‍රසාද ස්නාපනය
3 පූජකවරය 4 පාපොච්චාරණය (ල 10)

6) නාමන්ගේ කුෂ්ඨය සුව කලේ
1. එලියා දිවැසිවරයා 2. එලිෂා දිවැසිවරයා 3. නාතාන් දිවැසිවරයා 4. යෙසායා දිවැසිවරයා

7) නාතාන් දිවැසිවරයා …………….. රජතුමාව යහමඟට ගත්තේය
1. දාවිත් 2. සලමොන් 3. සාවුල් 4. ජෙරොබොවාම්

8) එලියා දිවැසිවරයා නියගයේ දී ……………………….. අත්දුටුවේය
1. දේව විශ්වාසය 2. දේව බලය 3. දිව්‍ය සංරක්ෂණය 4.දේව ප්‍රේමය

9) යෙසායා දිවැසිවරයාගේ නමේ අර්ථය,
1. ''දෙවියන් වහන්සේ ගලවන සේක''
2. දෙවියන් වහන්සේ උසස් කළ සේක''
3. ''දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක''
4. ''දෙවියන් වහන්සේ දර්ශනය වන සේක''

10) ජෙරමියා දිවැසිවරයාගේ පියා වන්නේ

1. ආමොස් ය 2. හිල්කියා ය 3. බුසී ය 4. ආරොන් ය

11) සුළු දිවැසිවරුන්ගේ වගකීම වන්නේ

1. ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව කියා දීමයි
2. දෙවියන් වහන්සේගේ පණිවිඩය ඉශ්‍රායෙල් ජනයා වෙත ගෙන යාමයි
3. දෙවියන් වහන්සේගේ පණිවිඩය වෙත ගෙන යාමයි
4. දෙවියන් වහන්සේගේ පණිවිඩය මිසර ජනතාව වෙත ගෙන යාමයි

12) සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා ලෙස හඳුන්වන්නේ,

1. එසෙකියෙල් 2. ජෙරමියා ය 3. යෙසායා ය 4. ආමොස් ය

13) ජෝනා දිවැසිවරයාලත් කැඳවීම වන්නේ

1. මිසර වැසියන්ව මනස්තාපනයට කැඳවීමයි
2. නිනීවේ වැසියන් මනස්ථාපයට කැඳවීමයි
3. එසෙනිවරු මනස්ථාපනයට කැඳවීමයි
4. බැබිලොනිය ජනතාව මනස්ථාපනයට කැඳවීමයි

14) ආබ්‍රහම් තුමාගේ ගම වුයේ

1. කානාන් 2. හාරාන් 3. ඌර් 4. පාරාන්

15) ''අහස දෙස බලා, හැකි නම්, ඔය තාරකා ගණන් කරන්න'' මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

1. දෙවියන් වහන්සේ විසින් ආබ්‍රහම්ට
2. දෙවියන් වහන්සේ විසින් ආදම්ට
3. දෙවියන් වහන්සේ විසින් ඊසාක්ට
4. දෙවියන් වහන්සේ විසින් මොසෙස්ට

16) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ

A – දේදුන්න
B – චර්මඡේදනය
C – වළාකුල
D - ගිනි ටැඹ

මේවායින් නිවැරදි පිළිතුර වන්නේ

1. C ය 2. A ය 3. D ය 4. B ය

17) ''ඊසාක්'' යන්නෙහි අර්ථය කුමක් ද?

1. ජලයෙන් ගත් 2. වැළපීමයි 3. සතුටු වීමයි 4. සිනාසීමයි

18) ආබ්‍රහම් තම එකම පුතා යාග කිරීමට රැගෙන ගියේ

1. කානාන් දේශයට ය 2. පොරොන්දු දේශයට ය 3. මොරයා දේශයට ය 4. හාරාන් දේශයටය

19) ''බෙතෙල්'' යන්නෙහි අර්ථය වන්නේ

1. දේව දූතයන්ගේ ගෘහයයි 2. දෙවියන් වහන්සේගේ ගෘහය යි
3. දෙවියයන් වහන්සේගේ පුත්‍රයාය 4. දෙවියන් වහන්සේගේ දූතයා ය

20) පොර බදා ජයගත් පසු ජාකොබ් තුමාට ලැබුණු නම

1. ඉශ්‍රායෙල් 2. ආබ්‍රම් 3. විශ්වාසයේ පිය 4. ජාතීන්ගේ පියා

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් එක් ප්‍රශ්නයකට ලකුණු 11 ක් බැගින් ද දෙන්න.**

1) ඔබ පන්ති කාමරය තුළ කරන ලද ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
   1) පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න (ල 02)
   2) නිනීවේ වැසියන්ට තම පාප වලින් මිදී මනස්ථාපනයට කැඳවූ දිවැසිවරයා කව්රුන් ද? (ල 02)
   3) ''ආබ්‍රහම්'' යන නමෙහි අර්ථය කුමක් ද? (ල 04)
   4) අසරණ වන අවස්ථා වල දෙවියන් වහන්සේගෙන් අප ලබන ජීවිත සුරක්ෂිත භාවය හඳුන්වන්නේ කෙසේද? (ල 04)
   5) දිවැසිවරයා යනු කව්රුන්දැයි හඳුන්වන්න (ල 04)

(මුළු ලකුණු 16කි)

2)
   1) ආබ්‍රහම් තුමා ගේ කැඳවීමේ ප්‍රධාන අංග 02 ලියන්න
   2) ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදුවූ දේවල් 03 ලියන්න

3)
   1) ප්‍රධාන දිවැසිවරුන් තුන් දෙනා නම් ලියන්න
   2) ඔබගේ පන්තියේ මිතුරන් දෙදෙනෙක් කළහ (රණ්ඩු) කරන විට යහපත් මිතුරෙකු ලෙස, ඔබට කළ හැකි දේවල් 06ක් ලියන්න

4)
   1) සුළු දිවැසිවරුන් 06 දෙනෙකු ගේ නම් ලියන්න
   2) ඔබ සහ ඔබගේ පවුලේ අයව, දෙවියන්ගේ ආරක්ෂා ගේ ආරක්ෂාවට බාර කරමින් යාච්ඤාවක් නිර්මාණය කරන්න

5)
   1) දස පණතේ, පළමු වන පණත ලියන්න
   2) දේවස්ථානයේ දී, එහි ගරුත්වය ආරක්ෂා කරමින් ක්‍රියාකළ යුතු ආකාර 06 ක් ලියන්න

6)
   1) මිනිසා අන් මැව්ලිවලට වඩා උසස් නිසා දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිතයක් ගත කිරීමට කළ හැකි ක්‍රියාවන් 05 ක් ලියන්න
   2) දෙවියන් වහන්සේ විසින් ඔබට දෙන ලද වරප්‍රසාද උපයෝගී කර ගනිමින් ඔබ විසින් කරනු ලබන ක්‍රියාවන් 05 ක් ලියන්න

7)
   1) ආබ්‍රහම් තුමාගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න
   2) එතුමා තුල ඇති යහපත් ගතිගුණණ ඔබ ජීවිතයෙන් පෙන්නුම් කරන ආකාරය කරුණු 03 කින් පැහැදිලි කරන්න